**මන්මුනෙයි ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.191,400 ක් වටිනාකමට පරිගණක මිලදී ගත් බවට සඳහන් කර පිළිවෙලින් හර හා බැර කිරීම් සිදුකර තිබුණි. එසේ වුවත්, සභාව විසින් පරිගණක කිසිවක් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන නොතිබුණි.

(ආ) 2015 සහ 2016 වර්ෂවලදී JCB වාහනය කුලියට දීම වෙනුවෙන් පිළිවෙලින් රු.59,280 ක් සහ රු.1,040,225 ක මුදලක් ආදායම් වශයෙන් ලැබී තිබුණත්, එම වර්ෂවල ආදායම් ගිණුම්වල බැර නොකර තැන්පත් ගිණුමේ සමාලෝචිත වර්ෂයේදීත් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බොරළු මාර්ග ඉදිකිරීම සහ කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීම සඳහා වියදම රු.3,174,931 ක් ආදායම් වියදම් ගිණුමේ ද්‍රව්‍ය වියදම් වශයෙන් ඉදිරිපත් කිරීම වෙනුවට ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ඈ) පොදු සුසාන භූමියක් සඳහා ඉඩමක් අත්පත් කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම්වරයාට ලියන ලද රු.2,400,000 ක චෙක්පත ලබා නොදී හා අදාළ ඉඩමේ අයිතියද මාරු නොකර තිබියදී මූල්‍ය ප්‍රකාශනවල මෙම වටිනාකම වත්කම් වශයෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ‘නෙල්සිප්’ වැඩසටහන යටතේ රු.550,672 කට ලී බඩු මිලදී ගෙන තිබුණි. මෙය ලී බඩු ගිණුම යටතේ ඉදිරිපත් නොකර පුස්තකාල ගොඩනැගිලි ගිණුම යටතේ ඉදිරිපත් කර තිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1987 වර්ෂයේ සිට 1993 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා විදුලිය පාරිභෝගිකයන්ගෙන් අයකර ගත යුතු සහ ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු පිළිවෙලින් රු.781,370 ක් සහ රු.1,958,631 ක් අයකර ගැනීමට සහ ගෙවීමට කටයුතු නොකර අඛණ්ඩව මූලා‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ)** 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූලා‍ය හා පරිපාලන රීති | |
| (i) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 197 වගන්තිය | සෑම මාසයක් අවසානයේදීම පරිභෝජන ගබඩා භාණ්ඩ ලේඛනය ලේකම්වරයා විසින් පරීක්ෂා කොට අත්සන් කර නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 10,346,935කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 6,923,090 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,423,845ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 හිඟ ආදායම්

-------------

සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ ලැබිය යුතු වාහන හිඟ කුලී රු. 990,095ක් ලබාගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

------------------

තිරසාර සංවර්ධන අරමුණු

---------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 20 දිනයේදී මඩකලපුවට දේශපාලන නායකයින්ගේ සපැමිණීම වෙනුවෙන් ආරෙයම් පදි මාර්ගය හරහා පිළිගැනීමේ බැනරයක් ස්ථාපිත කිරීම සඳහා සභාව විසින් රු.239,950 ක් වැයකර තිබුණි. එසේ වුවත්, දේශපාලන විරෝධතා හේතුවෙන් එම පිළිගැනීමේ බැනරය 2018 ජුනි 05 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණු අතර එහි කොටස් කාර්යාල පරිශ්‍රයේත් හා සංස්කෘතික ශාලා පරිශ්‍රයේත් තබා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ බැට්මින්ටන් ගෘහස්ථ ක්‍රීඩාංගනයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා රු.314,520 ක් වැය කර තිබුණි. එසේ වුවත්, මෙම කාර්යය සඳහා ඇස්තමේන්තුවක් සකස් කර නොතිබූ අතර වැඩ නිම කිරීමේ ප්‍රමාණය තක්සේරු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පුස්තකාල 06 ක් පැවතුණි. එසේ වුවත්, පුස්තකාලයාධිපති තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 01 ක් පමණක් සමාලෝචිත වර්ෂය වන විටත් පැවතුණද, සේවක සංඛ්‍යාව වැඩිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කිසිවක් සභාව විසින් ගෙන නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

2015 වර්ෂයේ පැවැති මැතිවරණයේදී සභාවේ නිලධාරීන් මැතිවරණ රාජකාරීවල නිරත වීම වෙනුවෙන් සහ එයට සම්බන්ධිත වියදම් වශයෙන් රු.85,322 ක් සභා අරමුදලින් වැය කර තිබූ නමුත් සභාව විසින් අදාළ කාලපරිච්ඡේදය තුළ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් මෙම ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
| --- | --- |
| (අ) ගිණුම් තැබීම | ලෙජර ගිණුම් යාවත්කාලීනව හා නිසි අයුරින් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) ආදායම් කළමනාකරණය | ආදායම් මූලාශ්‍රයන් හඳුනා ගෙන ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ගෙවීම් කිරීම | ඉදිකිරීම් කාර්යයන් සඳහා ගෙවීම් කිරීමේදී අදාල බිල්පත් තහවුරු කිරීම් මගින් ගෙවීම් සිදු කළ යුතුය. |